1317

07 MAR 2019

මගේ අංකය :- 23/3/5
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
මුතුකණ්ඩිය ව්‍යාපාරය
සියඹලාණ්ඩුව
2019.01.23

මුතුකණ්ඩිය ව්‍යාපාරයේ සියලුම
ව්‍යාපාර කමිටු සාමාජිකයින් වෙත,

**ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව - 2019 ජනවාරි මාසය.**

මුතුකණ්ඩිය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ මාසික ව්‍යාපාර කමිටු රැස්වීම 2019.01.22 දින පෙ:ව:9.00 ට මුතුකණ්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ දී පැවැත්විය.

සහභාගී වූ නිලධාරීන් :-

| | |
|---|---|
| 01. එල්.සරත් පෙමසිරි සිල්වා මහතා | - නේවාසික ව්‍යාපාර කළමනාකරු,මුතුකණ්ඩිය |
| 02. එස්.එම්.අයි.මධුරංග මහතා | - ඉංජිනේරු සහකාර,වාරිමාර්ග ඉංජි:කාර්යාලය |
| 03. අයි.එල්.නව්ෂාඩ් මහතා | - කෘෂිකර්ම උපදේශක |
| 04. එච්.එම්.අසංක නුවන් ප්‍රසන්න මහතා | - තාක්ෂණ සහකාර, වාරිමාර්ග ඉංජි:කාර්යාලය |
| 05. එච්.ආර්.සී.පී.කුමාර මහතා | - කෘෂිකර්ම උපදේශක,සියඹලාණ්ඩුව |
| 06. පී.එම්.පී.ජයතිස්ස මහතා | - කෘෂි උපදේශක කාර්යාලය,සියඹලාණ්ඩුව |
| 07. ජී.එම්.සී.පී.රුවන්සිරි මහතා | - කෘෂි උපදේශක කාර්යාලය,සියඹලාණ්ඩුව |
| 08. ඊ.තුලාන්ජන් මහතා | - කෘෂි උපදේශක කාර්යාලය,සියඹලාණ්ඩුව |
| 09. ජේ.ජී.පී.කේ.පියසේන | - කෘෂි උපදේශක කාර්යාලය,සියඹලාණ්ඩුව |
| 10. ආර්.එම්.පියරත්න මහතා | - සංවර්ධන නිලධාරී,ව්‍යා.කළ:කාර්යාලය |
| 11. කේ.එම්.ඩබ්.උදය කුමාර මහතා | - සංවර්ධන නිලධාරී,ව්‍යා.කළ:කාර්යාලය |

සහභාගී වූ ගොවිසංවිධාන නියෝජිත වරුන් :-

| | |
|---|---|
| 01. ටී.ඩබ්.විමලාවතී මිය | - භාණ්ඩාගාරික,එකමුතු ගො.සං. |
| 02. ඩී.පාලිත උඩවත්ත මහතා | - සභාපති,ගැමුණු ගො.සං |
| 03. ඩී.එම්.ගුණසේකර මහතා | - සභාපති,රණමයූර ගො.සං. |
| 04. එච්.එම්.ආරියදාස මහතා | - භාණ්ඩාගාරික,රණමයූර ගො.සං. |
| 05. ආර්.එම්.ජිනදාස මහතා | - ලේකම්,රණමයූර ගො.සං. |
| 06. ජේ.එම්.එන්.කරුණාතිලක මහතා | - ලේකම්,සිරිපැරකුම් ගො.සං. |
| 07. කේ.පී.ගාමිණී ද සිල්වා මහතා | - සභාපති,සිරිපැරකුම් ගො.සං. |
| 08. ඩබ්.එම්.සුදුබණ්ඩා මහතා | - භාණ්ඩාගාරිකක,එක්සත් ගො.සං. |
| 09. කේ.ජී.සුමිත් මහතා | - ලේකම්,විජිතපුර ගො.සං. |
| 10. ආර්.එම්.මුතුබණ්ඩා මහතා | - සභාපති,විජිතපුර ගො.සං. |
| 11. එම්.පී.පීටර් විරසිංහ මහතා | - භාණ්ඩාගාරික ,විජිතපුර ගො.සං. |
| 12. කේ.ජී.චන්දන නිශාන්ත මහතා | - ලේකම්, ගැමුණු ගො.සං. |
| 13. ජේ.එච්.බන්දුසේන මහතා | - ලේකම්, එක්සත් ගො.සං. |
| 14. ජේ.එල්.චන්ද්‍රසිරි මහතා | - සභාපති, එක්සත් ගො.සං. |
| 15.ඊ.සලමන් අප්පුහාමි මහතා | - FC 55, ඇල නියෝජිත |
| 16.ආර්.එම්.අබේරත්න මහතා | - සිරිපැරකුම් ගො.සං.සාමාජික |
| 17. ඩබ්.ආරියවතී මිය | - FC 62, ඇල නියෝජිත |
| 18. ටී.එම්.බණ්ඩාරමැණිකා මිය | - සාමාජික ,එක්සත් ගො.සං. |

සහභාගී වූ ජල පාලක වරුන් :-

| | |
|---|---|
| 01. ඩී.එම්.නිමල් දිසානායක මහතා | - ජල පාලක වාරිමාර්ග දෙපා: |

- <u>පිළිගැනීම හා අරමුණු පැහැදිලි කිරීම</u> :-

ආගම සිහි කිරීමෙන් අනතුරුව පැමිණ සිටි නිලධාරීන් හා ගොවි නියෝජිත වරුන් සියලු දෙනා ව්‍යාපාර කළමනාකාර මහතා විසින් පිළිගන්නා ලදී.

අරමුණු පැහැදිලි කරමින් ප්‍රකාශ කර සිටියේ දෙවන වර ඇලවේලි සුද්ද කර මනා ජල කළමනාකරණයක් කරගැනීම, වගා ප්‍රගතිය හා ගැටලු සාකච්ඡා කිරීම, සේනා දලඹුවාගේ හානිය පිළිබඳ දැනුවත් කර වලක්වා ගැනීම, හිටපු කෘෂි උපදේශක මහතා ස්ථාන මාරුවක් ලැබී ඇති බැවින් ඇගයීමක් කර ස්තුති කිරීම, නව කෘෂි උපදේශක වරුන් දෙදෙනා හඳුනා ගැනීමක් බව පැහැදිලි කරන ලදී.

අනතුරුව පසුගිය ව්‍යාපාර කමිටු රැස්වීමේ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී. එහි සංශෝධන කිසිවක් නොවූ අතර, සත්‍ය වාර්තාවක් ලෙස ගැමුණු ගො.සං. සභාපති ඩී.පාලිත උඩවත්ත මහතා කළ යෝජනාව විජිතපුර ගො.සං ලේකම් .කේ.ජ්.සුමිත් මහතා විසින් ස්ථිර කරන ලදී.

| අනු අංක | විෂය ක්ෂේත්‍රය | සාකච්ඡා කල කරුණු /ගනුලැබූ තීරණ | වගකීම |
|---|---|---|---|
| 01 | ආයතන සංවර්ධනය | ★ගොවි සංවිධාන 06 හිම 2019 මාර්තු 31 ට ප්‍රථම ගිණුම් විගණනය කර අවසන් කළයුතු බව<br>★සියලුම ගොවි සංවිධාන වල නිළ වරණ ජුනි - ජූලි මාසවල පැවැත්විය යුත බව<br>★ගොවි සංවිධාන ගිණුම් වලින් මුදල් නිදහස් කිරීමේදී අදාල සියලු ලිපි ලේඛණ සම්පූර්ණ කර, අනුමැතිය ලබාදුන් මහසභා/කාරක සභා වාර්තාවේ පිටපතක් භාරදිය යුතු බව<br>★හොඳම ගොවි සංවිධානය තේරීමේ තරගය පවත්වා ඇ ? අතර,ඊට අදාල විෂයන්ට අනුව 2019 වර්ෂයේ ගොවි සංවිධාන කටයුතු සැළසුම් කලයුතු බව<br><br>විජිතපුර ගොවි සංවිධානයේ කාරක සභාව - 2019.01.23 දින<br>එක්සත් ගොවි සංවිධානයේ කාරක සභාව - 2019.01.24 දින | ගොවිසංවිධාන නිලධාරීන් / සංවර්ධන නිලධාරීන් |
| 02 | වගා කේෂ්තු ප්‍රගතිය | ගම්මාන 1 සිට 6 දක්වා සමස්ථ ව්‍යාපාරයේම මේ වන විට වී වගාව සාර්ථක මට්ටමක පවතින අතර,ඇතැම් ගම්මාන වල වගා නොකල කුඹුරු ඉඩම් වැඩි ප්‍රමාණයක් හඳුනාගෙන ඇත. වගා නොකිරීමට හේතු සොයා බලා ප්‍රාදේශීය ලේකම් තුමාද දැනුවත් කර සුදුසු ක්‍රියා මාර්ගයක් ගතයුතු බව සාකච්ඡා කරන ලදී.<br><br>දැනට වගා තත්වය - සමස්ථ ව්‍යාපාරයේම 50% පමණ බණ්ඩි මට්ටමේ පවතී. සෑම ගොවි සංවිධාන බල ප්‍රදේශයකම වගා නොකල ඉඩම් නාම ලේඛණයක් සතියක් ඇතුලත ලබා දීමට කටයුත කරන ලෙස ව්‍යාපාර කළමනාකාර මහතා දැන්වීය. | ගොවිසංවිධාන නිලධාරීන් / සංවර්ධන නිලධාරීන් |
| 03 | මෙහෙයුම් හා නඩත්තු | සියලුම Dඇලවල් FC ඇලවල් අගාවත දක්වා අපහසුවකින් තොරව ජලය රැගෙන යාම සඳහා කන්නය මැද සුද්ධ කලයුතු බව. එම වගකීම ගොවි සංවිධාන විසින් භාර ගන්නා ලදී.<br>ප්‍රධාන ඇලේ දැනට ජලය උතුරන ස්ථාන පරික්ෂාකර බලා සුදුසු වැඩ පිළිවෙලක් කඩිනමින් සකස් කලයුතු බව සාකච්ඡා විය. ඒ පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තු කේෂ්ත්‍ර නිලධාරීන්ගේ අවධානය යොමු කර , කඩිනමින් ඉටුකර දෙන ලෙසද ඉල්ලා සිටින ලදී. | සියලු ගොවිසංවිධාන<br><br>ඉංජි:සහකාර තාක්ෂණ සහකාර |

| | විෂය ක්ෂේත්‍ර | සාකච්ඡා කල කරුණු /ගනුලැබූ තීරණ | වගකීම |
|---|---|---|---|
| | මෙහෙයුම් හා නඩත්තු | සියලුම කෙත් ඇල හා බෙදුම් ඇලවල රක්ෂිත වෙන්කිරීමට වැඩ පිළිවෙලක් කඩිනමින් සකස් කලයුතු බවත්, DC 4 ඇලේ ඉතිරි කොටසේ රක්ෂිත වෙන්කර ගැනීමට අදාල රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වීම අවශ්‍ය බවත් එක්සත් ගො.සං.ඉල්ලා සිටින ලදී.<br><br>DC 4 ඇලේ ට්‍රැක්ටර් හා වාහන සෝදන ස්ථානය නිසා පාර සහ ඇලට හානි සිදුවන බැවින් ඒ සඳහා විසඳුමක් ගතයුතු බව එක්සත් ගො.සං.ලේකම් මහතා පැවසීය.<br><br>ගම්මාන 3 නිවාස ව්‍යාපෘතියට ඉඩම් ලබාදී ඇති කොටසේ ප්‍රධාන ඇලට ආසන්නව දැනට ඉතිරිව ඇති රක්ෂිත ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමට අවවාදාත්මක නාම පුවරුවක් සවිකල යුතු බව රණමයුර ගොවි සංවිධාන නිලධාරීන් පවසන ලදී.<br><br>PEISEIP ව්‍යාපෘතිය යටතේ මේ වන විට මූලික දත්ත සමීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර, ඇල පද්ධතියේ ප්‍රධාන ගැටලු හඳුනා ගැනීමේ ක්ෂේත්‍ර කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.පෙබරවාරි මාර්තු මාස තුල ඒකාබද්ධ ක්‍රියාත්මක සැළැස්ම සැකසීම ගම්මාන මට්ටමින් සිදු කිරීමට සැළසුම් කර ඇති බව නේ.ව්‍යාපාර.කළමනාකාර මහතා පැවසීය. | අදාල නිලධාරීන් සහ ගො.සං. නිලධාරීන්<br><br>නේ.ව්‍යා. කළමනාකරු සංවර්ධන නිලධාරීන් |
| 04 | වාරිමාර්ග කටයුතු | දැනට වැවේ පවතින ජල ධාරිතාවය අක්:අඩි 11500 ක් පමණ බවත් ඉන් අක්:අඩි 9500ක් පමණ නිකුත් කල හැකි බවත් ඉංජිනේරු සහකාර මහතා පැවසීය. වැවේ හදිසි ආරක්ෂක දොර සවිකර ඇති බවත්, අනෙක් දොර සකස් කරමින් පවතින බවත් එය අවසන් වූ විගම සවිකිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.<br><br>මීට පෙර අවස්ථා කීපයකදී JCB යන්ත්‍රය ගොවිසංවිධාන වලට ලබා දීමට එකගවූ නමුත් දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ තිබෙන යන්ත්‍රය වෙනත් විශේෂ වැඩ සඳහා ලබාදීමට සිදුවීම නිසා මුහුකණ්ඩිය ව්‍යාපාරයට ලබාදීමට නොහැකි වූ බව ඉංජිනේරු සහකාර මහතා පැවසීය. | |
| 05 | වාරි ගැටලු | ජලය අනවසර අයුරින් පරිහරණය කරන්නන් හා ඇල පද්ධතිය විනාශ කරන අය සඳහා නීතිමය පියවරක් ගතයුතු බවත්,ඒ සඳහා ගොවිසංවිධාන සහය හා නිලධාරීන්ගේ මැදිහත් වීමක් අවශ්‍ය බව ගැමුණු ගො.සං. සභාපති ඩී.පාලිත උඩවත්ත මහතා ප්‍රකාශ කරන ලදී.<br>ගම්මාන 4-3 ඇතුලු අනෙකුත් ගම්මාන වල CRIP ව්‍යාපෘතිය මගින් පුණරුත්ථාපනය කළ ඇලවල් වල පස් වැඩ නොකිරීම නිසා අසාර්ථක වී ඇති බවත්, ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිත PEISEIP ව්‍යාපෘති මගින් හෝ පස් වැඩ කිරීම සඳහා වැඩි අවධානයක් යොමුකල යුතු බව සිරිපැරකුම් ගො.සං.සභාපති ගාමිණී ද සිල්වා මහතා යෝජනා කරන ලදී. | |
| | | ගම්මාන 5 එක්සත් ගො.සං.බල ප්‍රදේශයේ වගා නොකල කුඹුරු 35 පමණ ඇති අතර ඒ හේතුවෙන් ඇලවල් ශුද්ධ කිරීමේ ගැටලුව බවතින බව එක්සත් ගො.සං.සභාපති ජේ.එල්.චන්ද්‍රසිරි මහතා ප්‍රකාශ කරන ලදී.<br>නිවෙස් වලට යාමට D ඇලවල් හරහා පෞද්ගලිකව ඉදිකරගෙන ඇති කුඩා පාලම් වල පළල වැඩිවීම නිසා ඇල සුද්ද කිරීමේදී ගැටලු ඇති වන බවත් ඒ | |

| | | | |
|---|---|---|---|
| | | සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස FC55 ඇල නියෝජිත සොලමන් අප්පුහාමි මහතා ප්‍රකාශ කරන ලදී.<br>CRIP ව්‍යාපෘතිය මගින් ගම්මාන 6 හි සාදන ලද ඇලවල් වල කුඹුරු බටවල ගැටලු පවතින බැවින් ඒවා සකස් කර දෙන ලෙස විජිතපුර ගො.සං. සභාපති ආර්.එම්.මුතුබණ්ඩා මහතා ඉල්ලා සිටින ලදී. | |
| 06 | කෘෂිකර්ම සංවර්ධනය | ස්ථානභාර කෘෂි උපදේශක, චානක කුමාර මහතා -<br>තමා වැඩ භාරගැනීමෙන් පසු සහභාගිවන පළමු ව්‍යාපාර කමිටු රැස්වීම මෙය බැවින් ගොවි සංවිධාන නිලධාරින් අද දින හඳුනාගැනීමට හැකි වූ බවත්, ගොවිසංවිධාන සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ඉටුවිය යුතු උපරිම දායකත්වය ලබාදීමට කටුයුතු කරන බව පැවසීය. වෙනත් ව්‍යාපාර වල වී වගාව සඳහා මයිටා හානිය හා කීඩෑ උවදුර බවතින බැවින් ඒ පිළිබඳව ගොවින් අවධානයෙන් සිට හානියක් දුටු වහාම කෘෂි උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා සිටින ලදී.<br><br>කෘෂිකර්ම තාක්ෂණ නිලධාරී, පුබුදු මහතා -<br>දැනට වී වගාව සඳහා පොහොර නිර්දේශය අනුව වර්ග 3 ක් පමණක් යෙදීමෙන් අස්වැන්නේ හොඳ බලපෑමක් ඇති නොවන බවත්, කාබනික පොහොර යෙදීම හා ගැබුරට සී සෑම මගින් අස්වැන්න වැඩිකර ගැනීමට හැකිවන බව පැවසීය.<br><br>හිටපු ස්ථානභාර කෘෂිකර්ම උපදේශක,අයි.එල්.නව්ෂාඩ් මහතා-<br>තමාගේ සේවා කාලය තුල සහයෝගය දැක්වූ රාජ්‍ය නිලධාරින්ට සහ ගොවි සංවිධාන නියෝජිත් වරුන් සැමට ස්තූතිය ප්‍රකාශ කළ අතර ම, යම් අතපසුවීමක් සිදුවී ඇත්නම් සමාව ඉල්ලා සිටින බව ද ප්‍රකාශ කරන ලදී. | |
| 07 | 2018 අධ්‍යයන චාරිකාව | 2018 දෙසැම්බර් මස 19-20-21-22 දින යොදාගෙන යාපනය -වව්නියාව ප්‍රදේශයේ කළ අධ්‍යයන චාරිකාවට සහභාගී වීම මගින් දැනුම,කුසලතාව,ආකල්ප සංවර්ධනය ඇතිකර ගැනීමට ඉවහල් වූ බවත්, ඒ සඳහා ප්‍රතිපාදන ලබාදුන් වාරිමාර්ග කළමනාකරණ අධ්‍යක්ෂ තුමියටත්,ව්‍යාපාර කළමනාකාර මහතාටත්, භාෂා පරිවර්තක ලෙස කටයුතු කල කෘෂි උපදේශක අයි.එල්.නව්ෂාඩ් මහතාටත්, සම්බන්ධී කරණ කටයුතු වලට සහය වූ කෘෂි උපදේශක වරුන් ඇතුලු සියලු නිලධාරින්ටත්, ගොවිසංවිධාන නියෝජිත වරුන් විසින් ස්තූතිය ප්‍රකාශ කරන ලදී. | |

ස්තූතිය හා නිමාව

නේවාසික ව්‍යාපෘති කළමනාකරු, මුතුකණ්ඩිය -

2019 වර්ෂයේදී ගොවිසංවිධාන ශක්තිමත් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක PEISEIP ව්‍යාපෘතිය මගින් දායකත්වය ලබාගැනීමට හැකියාව පවතින බැවින් ගොවි සංවිධාන නිලධාරින් මීට වඩා කැපවීමෙන් හා සක්‍රිය දායකත්වයක් ලබාදිය යුතු බවත්, ඒ සඳහා අනෙකුත් සියලු රේඛීය ආයතන වල මැදිහත්වීම ලබා දීමට තමා කටයුතු කරන බවත් ප්‍රකාශ කරමින් පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය ප්‍රකාශ කරමින් රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

එල්.සරත් පෙම්සිරි සිල්වා
නේවාසික ව්‍යාපෘති කළමනාකරු
මුතුකණ්ඩිය ව්‍යාපාරය